කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
--------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 25 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 28 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය සඳහා දරා තිබුණු රු.44,409,776 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ii) | සභාව සතු රු.4,801,000 ක් වටිනා ඉඩමක් අඩුවෙන් හා මැනුම් නොකළ ඉඩම් 13 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (iii) | ඉඩම් වෙන්දේසි කිරීමෙන් ලැබූ ආදායම රු.2,033,912 ක් ඉඩම් ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (iv) | ඖෂධ තොගය හා පොදු ගබඩා ශේෂය භෞතිකව ගණනය කර ගිණුම්ගතකර නොතිබුණු අතර භෞතිකව නොතිබුණු රු.4,837,105 ක ජල කර්මාන්ත භාණ්ඩ තොගයක් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (v) | අලුත්වත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ සභාවට අදාළ ලාභය පමණක් ගිණුම්ගත කළයුතු වුවත්, සමස්ථ ආදායම හා වියදම ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (vi) | රු.279,088 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.40,421,743 ක් වූ ගිණුම් විෂයයන් 11 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.6,769,292 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සොයාබලා ගිණුම් නිවැරදි කිරීම් කළ යුතුවේ. | පිළිගනිමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 2 ක එකතු වටිනාකම රු.15,292,601 ක් වූ අතර එම ශේෂය වසර 1 ක කාලයක් ඉක්මවා තිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ii) | වසර 1 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂයන්හි එකතුව රු.56,687,206 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.20,129,706 ක් වූ ගිණුම් විෂයයන් 3 කට අදාළව තොග ලේඛන, තැන්පත් ලේඛන, භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා අගරු චෙක්පත් වලට අදාළ විස්තර යනාදි සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | විගණනයෙන් පෙන්වා දී ඇති අඩුපාඩුව පිළිගනිමි. |

1.4 අනුකූල නොවීම

--------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ, | | | |
| (i) 19 (xii) වගන්තිය | විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබානොගෙන කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘති පරිශ්‍රය හා සිව් මහල් ගොඩනැගිල්ලක් වසර 10 ක කාලයක් සඳහා බදු දී තිබුණි. | ආයතන පරිශ්‍ර බදු දීමේදී ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කසළ ව්‍යාපෘතියට අනුමැතිය ලබාගෙන ඇත. |
| (ii) 149 වගන්තිය | සංචාරක හෝටල් මණ්ඩලයට ඉදිරිපත් කරන විධිමත් ගිණුම් කට්ටලය ලබා නොගෙන ආදායම් ලබාගැනීම හේතුවෙන් අයකර ගතහැකි ආදායමක් සභා අරමුදලට අහිමි වී තිබුණි. | සංචාරක මණ්ඩලයට ඉදිරිපත් කරන ගිණුම් වාර්තා ලබාගෙන ආදායම් අයකර ගත යුතුවේ. | ගිණුම් වාර්තා ලබා ගැනීමට සංචාරක මණ්ඩලයෙන් ඉල්ලා ඇත. |
| (iii) 154(1) වගන්තිය | අනුමැතියකින් තොරව ඉඩම් අනුබෙදීම් සිදුකර තිබූ අතර අදාළ බදු ආදායම සභාවට අහිමි වී තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අනුබෙදුම් අනුමැතියට ඉදිරිපත් කර නැත. |
| (ආ) 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 01 ඡේදයේ iii, iv , v හා 4 (ii) වගන්තිය | ගොඩනැගිල්ලක් බදුදීමේදී එකවර ගෙවීමේ මුදල් රු.600,000 ක් අයකර නොතිබුණු අතර ඇප තැන්පතු ද ලබාගෙන නොතිබුණි. | එකවර ගෙවීමේ මුදල් ලබාගෙන බදු දීමට කටයුතු කිරීම හා ඇප තැන්පතු ලබා ගැනීම කළ යුතුවේ. | බදු දීමක් නොවන හෙයින් එවැනි අය කිරීමක් අවශ්‍ය නැත. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.46,517,379 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.77,794,557 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
-----------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 9,938,681 | 9,981,743 | 7,094,801 | 7,511,399 | 9,731,513 | 9,949,917 | 6,019,180 | 6,888,502 |
| (ii) | කුලී | 6,863,272 | 10,418,822 | 8,449,819 | 17,258,864 | 6,154,373 | 9,586,887 | 7,744,037 | 15,045,495 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,332,000 | - | 5,816,917 | - | 6,530,000 | - | 6,335,981 | - |
| (iv) | වෙනත් ආදායම් | 6,218,200 | 789,600 | 16,957,085 | 2,400,518 | 5,759,000 | 1,030,381 | 9,589,355 | 2,211,495 |
| | | 25,352,153 | 21,190,165 | 38,318,622 | 27,170,781 | 28,174,886 | 20,567,185 | 29,688,553 | 24,145,492 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය
-----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රැස් කළයුතු සමස්ථ ආදායම රු.47,667,657 ක් වුවද, වර්ෂය තුළ රැස් කරන ලද ආදායම රු.38,318,622 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 80 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | පිළිගනිමි. |

2.2.3 කුලී
------

කඩ කුලී
-----------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මැණික්හින්න වෙළඳ සංකීර්ණවල කඩ කාමර 21 කින් රු.1,423,118 ක් හිඟව පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | තවදුරටත් රු.411,399 ක මුදලක් අය වීමට ඇත. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙළින් රු.700,000 ක් හා රු.109,586,824 ක් විය. | අදාළ මුදල් ගෙන්වා ගැනීමට කළ යුතුවේ. | අය වෙමින් පවතී. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **අතුරු ව්‍යවස්ථා** | | |
| | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 20 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයාගැනීම කළ යුතුවේ. | දැනට අතුරු ව්‍යවස්ථා 20 ක් පනවාගෙන ඇත. |
| (ආ) | **අපේක්ෂිත නිමවුම් මට්ටම (out put) ලබා නොගැනීම** | | |
| (i) | රු.9,080,564 ක් වැයකර ඉදිකළ පල්ලේකැලේ රජරුපපොළ කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසර 3 ක් නිෂ්කාර්යව පැවතුණි. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී සුදුසු අය වෙත බදු දීමට කටයුතු කරමි. |
| (ii) | උපකාර්යාලයක් ඉදිකිරීම සඳහා රු.8,142,684 ක් වැයකර 2018 අගෝස්තු 17 දින වැඩ නිමකර ඇතත් උප කාර්යාලයක් ස්ථාපිත කර නොමැති අතර පහළ මාලයේ ඇති කඩ කාමර 4 ද බදු දීමට කටයුතු කර නොතිබුණි. | අපේක්ෂිත නිමවුම් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ලංසු කැඳවා ලංසු මුදල් ගෙවමින් පවතී. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| | | |
|---|---|---|
| කාබනික පොහොර අලෙවි කිරීම සඳහා සැලසුම්සහගත වැඩපිළිවෙළක් අනුගමනය කර නොමැති අතර, නොදිරන ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණයට යොමුනොකර පරිසරයට හානිවන අයුරින් බැහැර කර තිබුණි. | කසළ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේදී එහි නිමවුම වන පොහොර විකිණීම පිළිබඳ අවධානය යොමු කළ යුතුවේ. | කසළ සඳහා පිළියමක් ලෙස පොහොර නිපදවූවද වෙළඳපළට සරිලන පොහොර ලබා දීමට විශේෂඥ දැනුමක් සභාවට නැත. අලෙවි කිරීම පිළිබඳ සැලසුම් සහගත වැඩපිළිවෙළක් නැත. නොදිරන කසළ සම්බන්ධයෙන් ආයතන කිහිපයක් සමඟ සාකච්ඡා කර ඇත. ඉදිරියේදී ස්ථිර විසඳුමක් ලබා ගනිමි. |

(ඈ) තිරසාර සංවර්ධන ඉලක්ක

| | | |
|---|---|---|
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බලගොල්ල මොරගහපිටිය බහුකාර්ය ගොඩනැගිලි 2 ක කඩ කාමරවල තක්සේරුව ක්‍රියාත්මක නොකිරීම නිසා රු.15,744,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | තක්සේරු වටිනාකම මත කඩ කුලී අය කළ යුතුවේ. | ගිවිසුම් කාලය අවසන් වූ පසු නව තක්සේරුව ක්‍රියාත්මක කරමි. |
| (ආ) | සභා භූමියක 2013 වසරේ සිට අනවසරයෙන් මී කිරි අලෙවිහලක් පවත්වාගෙන ගියද සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අනවසර වෙළඳසැල් ඉවත් කළ යුතුවේ. | ගිවිසුම්ගත වී තක්සේරු කුලී අය කරමින් පවතී. ස්ථිර තක්සේරුවක් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යවා ඇත. මෙම ඉඩම සඳහා නඩු කටයුත්තක් පැවැත්වෙන බැවින් නඩුව නිමවූ පසු ඉදිරිපත් කරමි. |
| (ඇ) | නිවාස අධිකාරියෙන් පොදු කටයුතු සඳහා ලබාදුන් ඉඩමේ පවත්වාගෙන යන කිරිහල තක්සේරු කර බදු මුදල් අයකර නොතිබුණි. | ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර බදු දීමට කටයුතු කළ යුතුවේ. | 2015 සිට ගෙවා නොමැති බදු කුලී මුදල් ගෙවීමට ඉල්ලීම් කර ඇත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තනතුරු 6 ක සේවක පුරප්පාඩු 9 ක් හා තනතුරු 3 ක සේවක අතිරික්තතා 4 ක් විය. | අතිරික්තතා ඇති නොවන ලෙස ද පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ද කටයුතු කළ යුතුවේ. | බඳවා ගැනීමට කටයුතු කරමින් සිටින බව දන්වමි. |
| (ආ) | ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 5 දෙනෙකුගෙන් රු.927,087 ක ආපදා ණය ශේෂයක් අයවීමට තිබුණි. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | එක් නිලධාරියෙකුගේ හැර අන් අයගේ ශේෂ අය වෙමින් පවතී. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.5,369,900 ක් වටිනා වාහන 05 ක් නිෂ්ක්‍රීයව පැවතුණි. | ප්‍රයෝජනයට ගතහැකි වත්කම් අලුත්වැඩියා කිරීමටද නිෂ්ක්‍රීය වත්කම් අපහරණය කිරීමටද කටයුතු කළ යුතුවේ. | 36 ශ්‍රී 3571 හා 42-1472 ආපසු භාර දීමට කටයුතු කෙරේ. CPTM - 9979, CPRW - 4044 වෙන්දේසි කිරීමට කටයුතු කෙරේ. 65 – 3933 පවරා ගැනීමට කටයුතු කෙරේ. |
| (ආ) | 2015 ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ රු.615,820 ක් වැය කර ව්‍යායාම උපකරණ මිලදීගෙන තිබුණද කායවර්ධන මධ්‍යස්ථානයක් ස්ථාපිත කර නොතිබුණි. | මධ්‍යස්ථානය විවෘත කර සේවය සැපයීමට කටයුතු කළ යුතුවේ. | වගකීම භාර ගැනීමට නොහැකි නිසා මධ්‍යස්ථානය වසා ඇත. කාර්යාල නිලධාරීන් ශරීර සුවතා සඳහා භාවිතා කරයි. |

3.5 ආර්ථික නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් 2017 වර්ෂයේදී රු.1,500,000 ක් වටිනා කසළ හලන යන්ත්‍රයක් මිලදී ගෙන රු.500,000 ක මුදලක් ගෙවා තිබුණද ප්‍රයෝජනයකට නොගෙන කොම්පෝස්ට් අංගනයේ දමා තිබුණි. | යන්ත්‍රය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම යන්ත්‍රය මාස දෙක තුනකින් ක්‍රියාත්මක වීමෙන් පසු අක්‍රීය විය. මෙම යන්ත්‍රය යථා තත්වයට පත් කිරීම ආයතනයක් ඉදිරිපත් වී ඇති බව දන්වමි. |

3.6 ප්‍රසම්පාදනය

කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2015 වර්ෂයේදී සහා ප්‍රතිපාදන මත ගොඩනැගිල්ලක් ඉදිකිරීමට රු.25,914,615 වැයකර 2018 ජනවාරි 03 දින වැඩ අවසන් කර තිබුණු මන්තාරා ආයතනයට බදු දී තිබූ ගොඩනැගිල්ල සඳහා ගොඩනැගිලි සැලැස්මක් පිළියෙල කර අනුමත කර නොතිබුණු අතර බිම් මහලේ බිත්ති අසලින් සිව්වන මහලේ හා slab එක තුළින් බිත්ති දිගේ වතුර ගලාගෙන එමින් පැවතුණි. සිව්වන මහලේ බිත්ති තැනින් තැන පුපුරා තිබූ බවත්, ගොඩනැගිල්ලෙහි පිටත බිත්ති කපරාරු කර නොතිබීම හේතුවෙන් වැසි ජලය ඇතුළට කාන්දු වීමෙන් බිත්ති තෙත්වී දිය සෙවෙල් බැඳී තිබුණි. | ගොඩනැගිලි ඉදි කිරීමේදී සැලසුම් අනුමත කර ගත යුතු අතර ඉංජිනේරු උපදෙස් පරිදි ක්‍රියා කළ යුතුවේ. | සැලසුම් අනුමත කර නොගැනීමේ අඩුපාඩුව පිළිගනිමි. ගොඩනැගිල්ල ඉදිකිරීමේදී පවත්නා අඩුපාඩු සම්බන්ධයෙන් ඉංජිනේරු නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඇස්තමේන්තුගත රු.2,400,000 ක් වූ ආදායම් විෂයන් 6 කින් කිසිදු ආදායමක් උපයා නොතිබුණු අතර ප්‍රාග්ධන වැය විෂයයන් 6 ක් සඳහා වෙන්කළ රු.33,450,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් දරා නොතිබුණි. | තාත්ත්වික අයවැයක් පිළියෙල කළ යුතුවේ. | පිළිගනිමි. |

4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණනය සඳහා නිලධාරියෙක් පත් කර ඇතත් ප්‍රමාණවත් විගණනයක් සිදුකර විගණන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය සිදුකර වාර්තා ඉදිරිපත් කළ යුතුවේ. | සේවක පුරප්පාඩු පිරවූ පසු අභ්‍යන්තර විගණනය ක්‍රමවත් කරමි. |